රුහුණ විශ්වවිද්‍යාලය

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - 2018/2019

දෙවන සමාසික අවසාන පරීක්ෂණය - 2020 පෙබරවාරි

**SOC 6241 - සංවර්ධන සමාජ විද්‍යාව**

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(පැහැදිලි අත් අකුරින් පිළිතුරු ලිවිය යුතු ය.)

UNIVERSITY OF RUHUNA LIBRARY - MATARA 25 JAN 2021 T

කාලය : පැය 03 යි.

---

01\. i. සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන ආර්ථික දර්ශක දෙකක් හා සාමාජීය දර්ශක දෙකක් නම් කරන්න.

(ලකුණු 04)

ii. ඉන් ඔබ කැමති එක් සාමාජීය දර්ශකයක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

iii. සංවර්ධනය මැනීම සඳහා ආර්ථික දර්ශක පමණක් යොදා ගැනීම දෝෂ සහිත වන්නේ ඇයි?

(ලකුණු 05)

02\. i. එක්කෝ,

තුන්වන ලෝකයේ රටවල් සංවර්ධනය කර ගැනීමේදී නවීකරණවාදීන් පෙන්වා දෙන ආකාරයට බටහිර සංවර්ධන ආකෘති ඒ අයුරින්ම යොදා ගැනීම සාර්ථක උපාය මාර්ගයක් නොවන බව ලොව නන් දෙසින් ලැබෙන අත්දැකීම්වලට අනුව යළි යළිත් තහවුරු වී ඇත. ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කරමින් මේ බව තහවුරු කරන්න.

(ලකුණු 15)

ii. නැත්නම්,

වර්තමාන සංවර්ධන උපාය මාර්ග සඳහා දේශීය ඥානය භාවිත කළ හැකි ආකාරය ප්‍රායෝගික උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

03\. i. හරිත විප්ලවය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii. ශ්‍රී ලාංකීය සමාජ සන්දර්භයට හරිත විප්ලවයෙන් සිදුවූ බලපෑම විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

04. i. එක්කෝ,

(අ). තිරසර සංවර්ධනය පිළිබඳ කෙටි සාකච්ඡාවක යෙදෙන්න.

(ලකුණු 05)

(ආ). තිරසර සංවර්ධනය සඳහා අවශ්‍ය කාලීන උපාය මාර්ග කවරේ දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 10)

ii. නැත්නම්,

(අ). තුන්වන ලෝකයේ රටවල සංවර්ධනයේදී රාජ්‍ය නොවන සංවිධානවල (NGO) භූමිකාව වැදගත් කොට සලකන්නේ ඇයි දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 08)

(ආ). රාජ්‍ය නොවන සංවිධානවලට එරෙහිව එල්ලවී ඇති විවේචන මොනවාද?

(ලකුණු 07)

05. i. 1980 දශකයෙන් පසුව ශ්‍රී ලංකාවේ දුගීබව පිටුදැකීම සඳහා ආරම්භ කරන ලද ජාතික මට්ටමේ වැඩසටහන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

ii. එම එක් එක් වැඩසටහනේ දුර්වලතා පෙන්වා දෙන්න.

(ලකුණු 07)

06. i. තෙවන ලොව රටවල ඌන සංවර්ධනය විග්‍රහ කිරීම සඳහා පරාධීන න්‍යාය යොදා ගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 10)

ii. පරාධීන න්‍යායට එල්ල වූ විවේචන මොනවාද?

(ලකුණු 05)

07. පහත මාතෘකා අතුරින් තුනක් (03) පිළිබඳ සටහන් සපයන්න.

i. ප්‍රජා සංවර්ධනය (Community Development)
ii. සමීර් අමීර් (Samir Ameen)
iii. නූතනත්වය (Modernity)
iv. සහභාගිත්ව සංවර්ධනය (Participatory Development)
v. ඩබ්ලිව්. ඩබ්ලිව්. රොස්ටොව් (W.W.Rostow)

(එක් කොටසකට ලකුණු 5 බැගිනි.)

@@@@@@@@